# 03 පාඩම

## (ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය)

3.1 ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය

ක්‍රියා පදයක මුල් ස්වරූපය ධාතුව නමින් හැඳින්වෙයි. ක්‍රියාවක් අපට අවශ්‍ය පරිදි අර්ථ ගන්වා ගැනීමට ක්‍රියා මූලය හෙවත් ධාතුව අගට එක් කර ගන්නා ප්‍රත්‍ය ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය යැයි කියනු ලැබේ.

3.1.1.ක්‍රියාකාරකම

වගුවේ මුල් කොටුවේ යෙදී ඇති ක්‍රියා පදයට ගැලපෙන පිළිතුරු සහිත කොටුවල හරි ලකුණක් යොදන්න.

| ක්‍රියා පද | අතීත කාල | වර්තමා නකාල | අනාග තකාල | ඒ ක ව ච න | බහු වචන | ප්‍රථම පුරුෂ | මධ්‍යම පුරුෂ | උත්තම පුරුෂ | කර්තෘකාරක | කර්මකාර ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිපෙයි | | | | | | | | | | |
| බැලීණි | | | | | | | | | | |
| වැඩියහ | | | | | | | | | | |
| නැටෙන්නෙමි | | | | | | | | | | |
| විකිණීහි | | | | | | | | | | |
| සිතමු | | | | | | | | | | |
| කරන්නෝ | | | | | | | | | | |
| නැමෙහු | | | | | | | | | | |
| නැටෙන්නේ | | | | | | | | | | |
| පැදවෙහි | | | | | | | | | | |

The National e-learning Portal for The General Education

3.I.II. පහත 'බකට්' එක තුළ අවිධිමත්ව යොදා ඇති ක්‍රියා පද වගුවේ සුදුසු තැන්වල ස්ථානගත කරන්න.

| | අතීත කාල | | වර්තමානකාල | | අනාගතකාල | |
|---|---|---|---|---|---|---|
| **පුරුෂ** | **ඒක වචන** | **බහු වචන** | **ඒක වචන** | **බහු වචන** | **ඒක වචන** | **බහු වචන** |
| ප්‍රථම පුරුෂ | | | | | | |
| මධ්‍යම පුරුෂ | | | | | | |
| උත්තම පුරුෂ | | | | | | |

| | | | |
|---|---|---|---|
| නැටීය | නැටීමි | නටන්නෙහි | නටන්නෝය |
| නැටූහ | නටමි | නටන්නෙමු | නටන්නෙමි |
| නටන්නේය | නැටූමු | නටහු | නටයි |
| නටති | නැටූහ | නටන්නෙහු | නැටීහ |
| නටමු | නටහි | | |

e-thaksalawa The National e-learning Portal for ...

**3. .II. නාම විභක්ති ප්‍රත්‍යය**

නාමයක් හෙවත් ශබ්ද මූලයක් නාම පදයක් බවට පත්කර ගැනීමට නාමයේ අගට යොදන ප්‍රත්‍යය නාම විභක්ති ප්‍රත්‍ය නම් වෙයි.

3. II. I. ක්‍රියාකාරකම

I – V දක්වා වාක්‍ය සම්පූර්ණ කිරීමට වඩාත්ම සුදුසු පදය පහත පිළිතුරු තීරයෙන් තෝරා හිස්තැන වෙත යොදන්න.

I. ගොවියා ______________කුඹුර කොටයි.
II. __________ මිට අන්දර ගසකින් සකසා ගැනීම ඉතා යෝග්‍ය වේ.
III. __________ වනාහි ගොවියාගේ ප්‍රධානතම ආයුධයකි.
IV. පැරැන්නෝ කෘෂිකර්මාන්තය සඳහා යොදාගත් උපකරණ අතරින් ____________ ගෞරව කළහ.
V. අන්දරේ රාජාංගනයෙහි තිබූ ___________________ නෙත යොමු කළේය.

උදැල්ල උදැල්ල කෙරෙහි

උදැල්ලට උදැල්ලෙහි

උදැල්ලෙන්

3. II. II.'මුව' ශබ්දය සම්පූර්ණ කිරීම සඳහා නිවැරදි පදය පිළිතුරු තීරයෙන් තෝරා වගුවේ හිස් කොටු තුළ ස්ථානගත කරන්න.

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පෙර | මුවා | |
| කම් | මුවා | |
| කතු | මුවා විසින් | |
| කරනු | | මුවන් කරණ කොට |
| සපදන් | මුවාට | |
| අවධි | මුවාගෙන් | |
| සබඳ | | මුවන්ගේ |
| අදර | | |
| අලත් | මුව | |

මුවා කෙරෙහි මුවා කරණ කොට මුවන් විසින්

මුවන්ගෙන් මුවෝ මුවන්ට

මුවන් මුවාගේ මුවන් කෙරෙහි

මුවනි

3. II. III. ගසෙහි මුදුනේ ඇති "නාම ප්‍රකෘති " ස්වරාන්ත හලන්ත වශයෙන් තෝරා අදාළ භාජනයට යොමු කරන්න.







